සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved]

# විශාඛා විද්‍යාලය කොළඹ - 05
# Visakha Vidyalaya , Colombo - 05

## තුන්වන වාර පරීක්ෂණය - 2023 (2024)
## Third Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ගණිතය<br>**Mathematics** | 6 ශ්‍රේණිය<br>**Grade 6** | *පැය දෙකයි*<br>***Two hours*** |

**නම / අංකය ඃ** ........................................................................................................................

**I කොටස**

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

1) පිටු 40 අභ්‍යාස පොත් 05 ක මිල රු. 225 ක් නම් එක පොතක මිල සොයන්න.

2) 19 ප්‍රගණන ලකුණු මගින් නිරූපණය කරන්න.

3) $642\square$ මෙය 5 හි ගුණාකාරයක් නම් හිස් කොටුවට ලිවිය හැකි ඉලක්කම් මොනවා ද?

4) පහත දිනය සහ වේලාව අන්තර් ජාතික සම්මත ආකාරයට ලියන්න.

   (i) 2024 පෙබරවාරි හතරවන දා .....................


   (ii) පස්වරු 2 පසු වී මිනිත්තු 8 තත්පර 5 ......................

5) $x = 8$ වන විට පහත ප්‍රකාශන දෙකෙහි අගය සොයන්න.

   (i) $x + 2 =$ ......................

   (ii) $15 - x =$ ......................

6) පහත දැක්වෙන තරාදි තැටියේ ඇති වට්ටක්කා ගෙඩියේ ස්කන්ධය සොයන්න.




7) 10 සිට 20 දක්වා ඇති


   (i) සංයුක්ත සංඛ්‍යා සියල්ලම ලියන්න. ..............................................................

   (ii) ත්‍රිකෝණ සංඛ්‍යා සියල්ලම ලියන්න. ..............................................................

8) හිස්තැන් සම්පූර්ණ කරන්න.

$64 = 2^{\square} = 4^{\square}$

9)




(i) රූපයේ දැක්වෙන පතරොම භාවිත කර සෑදිය හැකි ඝන වස්තුව නම් කරන්න.


(ii) එම ඝන වස්තුවේ දාරයක දිග සොයන්න.

10) භාජනයක ඇති ජලය $4l\ 625ml$ කින් $1l\ 775ml$ ක් ඉවත් කළ පසු ඉතිරි වන ජල ප්‍රමාණය සොයන්න.

11) හිස්තැන් සම්පූර්ණ කරන්න.

$78 \times 1000 = \square \div 10 = \square$

12) ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාව ලියන්න. සංඛ්‍යා නාමය ලියන්න.





13) සුළු කරන්න.

$3198 \div 13$

14) 2:3 අනුපාතයට තුල්‍ය වූ අනුපාත දෙකක් ලියන්න.

15) පහත දැක්වෙන රූපයේ




(i) b මගින් දක්වා ඇති කෝණය කුමන වර්ගයට අයත් ද?

(ii) පරාවර්ත කෝණයක් රූපයේ ලකුණු කරන්න.

16) 1000 ට අඩු විශාලම ඔත්තේ සංඛ්‍යාව ලියන්න.

17) සුළු කරන්න.


$$\begin{array}{r} 12.4 \\ -\ \ 4.57 \\ \hline \\ \hline \end{array}$$

18) 5, 7, 8, 6 මෙම ඉලක්කම් හතරම භාවිතයෙන් ලිවිය හැකි සියස්ථානයේ 8 ද එකස්ථානයේ 5 ද යෙදෙන

(i) විශාලම සංඛ්‍යාව ලියන්න. .....................................

(ii) කුඩාම සංඛ්‍යාව ලියන්න. ....................................

19) සංඛ්‍යා රේඛාව මත ලකුණු කර ඇති නිඛිල ලියන්න.




20) වත්තක පොල් ගස් 20 ක් ඇත. පොල් කඩන වාරයකදී එක් එක් ගසකින් කඩා ගත හැකි වූ ගෙඩි ප්‍රමාණයන් පහත දැක්වේ. කැඩූ මුළු ගෙඩි ගණන සොයන්න.

| **ගසකින් කඩාගත හැකි වූ ගෙඩි ගණන** | **ගස් ගණන** |
|---|---|
| 10 | 4 |
| 12 | 9 |
| 13 | 7 |

## II කොටස

- **ප්‍රශ්න 6 කට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පාපැදි අලෙවි සැලක 2023 අවුරුද්දේ මුල් මාස 05 තුළ අලෙවි වූ පාපැදි ප්‍රමාණ පහත වගුවේ දැක්වේ.

| **මාසය** | **අලෙවිවූ පාපැදි ගණන** |
|---|---|
| ජනවාරි | 40 |
| පෙබරවාරි | 36 |
| මාර්තු | 30 |
| අප්‍රේල් | 42 |
| මැයි | 48 |

(i) ○ සංකේතයෙන් පාපැදි 08 ක් නිරූපණය වන සේ මෙම තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න. **(ලකුණු 05)**

(ii) වැඩිම පාපැදි ප්‍රමාණයක් අලෙවි වී ඇත්තේ කුමන මාසයේ ද? **(ලකුණු 01)**

(iii) මුල් මාස 05 තුළ දී අලෙවි වූ මුළු පාපැදි ගණන සොයන්න. **(ලකුණු 02)**

(iv) එක් පාපැදියක මිල රු. 20,000 ක් නම් ජනවාරි මාසයේ දී පාපැදි අලෙවියෙන් ලැබූ ආදායම සොයන්න. **(ලකුණු 02)**

---

(2) (a) (i) 1) $2 \times 2 \times 2$ දර්ශක අංකනය භාවිතයෙන් ලියා කියවන ආකාරය ලියන්න. **(ලකුණු 02)**

2) අගය සොයන්න. **(ලකුණු 01)**

(ii) $2^4 \times 3^2$ හි අගය සොයන්න. **(ලකුණු 02)**

(b) (i) 128 සංඛ්‍යාව 2 හි බලයක් ලෙස ප්‍රකාශ කරන්න. **(ලකුණු 02)**

(ii) ඉහත (i) හි ලැබුණු පිළිතුරෙහි පාදය සහ දර්ශකය ලියන්න. **(ලකුණු 02)**

(iii) $>$ හෝ $<$ හෝ $=$ ලකුණ යොදන්න.

$1^{20}$ .............. $2^{10}$ **(ලකුණු 01)**

---

(3) කුඩා සිල්ලර වෙළඳ සැලක විකිණීම සඳහා තිබුණ ධාන්‍ය වර්ග කිහිපයක ප්‍රමාණ පහත දැක්වේ.

| **ධාන්‍ය වර්ගය** | **ප්‍රමාණය** |
|---|---|
| කඩල | 3kg 400g |
| කව්පි | 2kg 350g |
| මුං ඇට | 2kg 500g |
| සෝයා | 1kg 600g |

(i) වෙළෙඳසැලේ තිබෙන ධාන්‍ය වර්ගවල මුළු ස්කන්ධය සොයන්න. **(ලකුණු 02)**

(ii) විකිණීමට තිබෙන කව්පි සහ සෝයා ප්‍රමාණ අතර වෙනස සොයන්න. **(ලකුණු 02)**


(iii) ඉහත ලැබුණ පිළිතුර කිලෝග්රෑම් වලින් ලියන්න. **(ලකුණු 01)**

(iv) මුං ඇට 1kg මිල රු. 1200 ක් නම් 1kg 250g ක මිල සොයන්න. **(ලකුණු 03)**

(v) ඒ සඳහා වෙළඳසැලට රු. 2000 ක් දුන් අයෙකුට ලැබෙන ඉතිරි මුදල සොයන්න.

**(ලකුණු 02)**

(4) (a) මෙම කොටු ජලයේ කුඩා කොටුවක වර්ගඵලය $1cm^2$ නම්,



(i) අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 01)

(ii) අඳුරු නොකළ කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 01)

(iii) අඳුරු නොකළ කොටසේ වර්ගඵලය සහ අඳුරු කළ කොටසේ වර්ගඵලය අතර වෙනස සොයන්න. (ලකුණු 01)

(iv) කොටු ජාලයේ අඳුරු කළ කොටු ගණන මුළු කොටු ගණනේ භාගයක් ලෙස ලියන්න. (ලකුණු 02)

(v) එම පිළිතුර දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න. (ලකුණු 01)

(b) (i) 4375m, කිලෝමීටර් සහ මීටර්වලින් දක්වන්න. (ලකුණු 01)

(ii) කුලනි ළඟ ඇති රිබන් පටි 03 ක දිග ප්‍රමාණය පහත දැක්වේ.

රතු - 2m 5cm

නිල් - 2m 65cm

කහ - 1m 80cm

දිගින් වැඩිම රිබන් පටියේ දිග සෙන්ටි මීටර්වලින් දක්වන්න. (ලකුණු 01)

(iii) රිබන් පටි තුනෙහිම මුළු දිග සොයන්න. (ලකුණු 02)

---

(5) (a) සෘජුකෝණාස්‍රයක දිග 1m සහ පළල 50cm ක් වේ.

(i) සෘජුකෝණාස්‍රයක් ඇඳ ඉහත මිනුම් ලකුණු කරන්න. (ලකුණු 01)

(ii) මෙහි දිග සහ පළල අතර අනුපාතය ලියන්න. (ලකුණු 02)

(iii) එය සරලම ආකාරයෙන් දක්වන්න. (ලකුණු 01)

(iv) ඉහත සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ලකුණු 02)

(b) එම පරිමිතියට සමාන සමචතුරස්‍රයක් සහ සමපාද ත්‍රිකෝණයක් ඇත.

(i) සමචතුරස්‍රයේ පාදයක දිග සොයන්න. (ලකුණු 02)

(ii) සමපාද ත්‍රිකෝණයේ පාදයක දිග සොයන්න. (ලකුණු 02)

(6) (a) (i) පැය 55 දින සහ පැය වලින් දක්වන්න. **(ලකුණු 02)**

(ii) **(ලකුණු 01)**

| මිනිත්තු | තත්පර |
|---|---|
| 4 | 34 |
| + 2 | 48 |
| | |

(iii) කොළඹ සිට මහනුවර බලා පිටත් වූ අරුණ පැය 3 යි. මිනිත්තු 25 කාලයකට පසු පස්වරු 2.10 ට නුවරට ළඟා විය. ඔහු කොළඹින් පිටත් වූ වේලාව සොයන්න. **(ලකුණු 02)**

(b) කාඩ්පත් 3 ක 9, 15, 21 යන සංඛ්‍යා ලියා ඇත.


(i) මෙම සංඛ්‍යා අතුරින් ත්‍රිකෝණ සංඛ්‍යාවත් නොවන සංඛ්‍යාව ලියන්න. **(ලකුණු 01)**

(ii) එම සංඛ්‍යා 03 හිම සියලුම සාධක වෙන වෙනම සොයන්න. **(ලකුණු 03)**

(iii) සංඛ්‍යා තුනටම පොදු සාධක ලියන්න. **(ලකුණු 01)**

---

(7)




(a) රූපයේ දැක්වෙන A භාජනයේ පබළු $x$ සංඛ්‍යාවක් ඇති අතර B භාජනයේ ඇති පබළු ගණන 60 කි.

(i) භාජන දෙකෙහිම ඇති පබළු ගණන දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. **(ලකුණු 01)**

(ii) A භාජනයේ ඇති පබළු ගණන B භාජනයේ ඇති පබළු ගණන මෙන් 03 ගුණයකි. A භාජනයේ ඇති පබළු ගණන සොයන්න. **(ලකුණු 01)**

(iii) A භාජනයේ පබළු ගණන ඉහත (i) ලබාගත් වීජීය ප්‍රකාශනයට ආදේශයෙන් මුළු පබළු ගණන සොයන්න. **(ලකුණු 02)**

(iv) ඉහත ලැබුණු පිළිතුරෙහි මුළු පබළු ගණන එක සමාන කුඩා පෙට්ටි 05 කට දමන ලදී. එක් පෙට්ටියක අඩංගු පබළු ගණන සොයන්න. **(ලකුණු 02)**

(v) ලැබෙන පිළිතුර ආසන්න දහයේ ගුණාකාරයට වටයන්න. **(ලකුණු 01)**

(b) සුළු කර පිළිතුර සරලම ආකාරයෙන් දක්වන්න. **(ලකුණු 03)**

$$\frac{2}{3}+\frac{5}{24}$$

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION · pesuru Prakashana Private Ltd. · Akura Pilot · සමනල දැනුම · සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**